## ජෛව විවිධත්වය



# බොදු සංස්කෘතික සෙවණ ලද බළපිටිය මාදු ගඟ

මහාචාර්ය ලක්ෂ්මන් වෛද්‍යසේකර

ශ්‍රී ලංකාවේ පවිත්‍ර ගංගා අතුරින් මහගු පරිසරයත් සොබාදහමත් යන එකතුව ඇති මිනිසා අතින් කෙලෙසීම් නොලද ගංගාවකි. මාදු ගඟ පිළිබඳ මා අදහස් දක්වනුයේ එය මා කුඩා කල සිට ම දැන හැඳින ගත් පරිසරයක් වූ හෙයිනි. මා උපන් ගෙදරට නුදුරින් ගලා බසින මේ ගඟ පරිසරයට අමතරව සාක්ෂි දරන සංස්කෘතික ආස්වාදයක් ද ලබා ඇති තැනකි. කොළඹ ගාලු මාර්ගයේ බළපිටිය කඩපොළ අවසන් වන තැන අප නම් කළ 'මහ පාලම' ඇත. මාදු ගඟ මහ පාලම යටින් බටහිර දෙසට ගලා ගොස් මුහුදට එකතු වන්නේ බළපිටි මෝදරිනි. මාදු ගඟ ගැන කිවයුතු දේ අපමණ ය. මුහුදට ගලා බසින පෙදෙසේ ඓතිහාසික පසුබිමක් ද ඇත. අප කුඩා කල සිට දන්නා එදා සිට ම කියැවෙන රේගුවේ ගොඩනැගිලි ඇත්තේ මෙතැන ය. මේ රේගුව ගොඩනැගිලි තුළින් ඇරඹි එහෙත් අද නොමැති පළමු සිද්ධාර්ථ පිරිමි ගුරු විදුහල ලංකා අධ්‍යාපන ඉතිහාසයේ අධ්‍යාපන කේන්ද්‍රස්ථානයක් වූ වැදගත් තැනකි. මෙතැන ගුරු මඩුල්ලේ අධිපති ගුරුදේව මුනිදස කුමාරතුංගයන් බව සඳහන් කළ හැකි ය.


එතුමා සමග ගුරු පරපුර ඇති කිරීමට සමත් වූවන් අතර රූපියල් තෙන්නකෝන්, ඩී. ඩී. පී. සමරවීර, පීටර් ද සිල්වා, ඇලන් පීටර් ද සොයිසා යන විද්වත්හු වූහ. ඔවුන් ගේ ආභාෂය ලත් මෙම පෙදෙසේ ජීවත් වූ අප උගත් දේ බොහෝ ය. මෙම ගඟ මුහුදට බැසීමට පෙර දකුණින් පිහිටියේ මොහොට්ටි වත්ත නැතහොත් මිගෙට්ටුවත්ත ය. වාදීභසිංහ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් උපන් ගම ය. ගඟ අසල ඇති උතුරු පෙදෙසේ පල්ලියවත්ත නමින් හැඳින්වෙන බිම කතෝලික පල්ලිය ඇත. බළපිටි ගමෙහි කතෝලික බැතිමතුන් නැතත් ඇල්පිටිය වැනි ඈත පෙදෙසින් පූජකවරයෙක් හා බැතිමත් පිරිස් වින් වරින් වර පූජා පවත්වනු දක්නට ලැබේ.

මහ පාලම මැදින් ගලා එන මාදු ගඟෙහි බළපිටි මෝදර උදකුක්ඛේප සීමා මාලකය ඇත. මෙම සීමා මාලකය අමරපුර නිකායේ ආරම්භක සීමා මාලකය යි. මෙම සීමා මාලකය දැන් පිහිටා ඇති පෙදෙසේ නොව පාලමේ නැගෙනහිර පෙදෙසේ පළමුව පිහිටු වූ බවට සාක්ෂි ඇත. අඹගහපිටියේ වැලිතර ඥාණවිමල තිස්ස පළමු අමරපුර නිකායේ මහ නාහිමියන් උපසම්පද කර්මයක් සිදු කළ සීමාව යි. අද එය පාලමෙහි සිට බටහිර පෙදෙසෙහි තනා ඇත.

බෞද්ධ සංස්කෘතියට නෑ සබඳකම් කියන මෙම මාදුගඟ උඩුගං බලා යන අපට ලක්දිව කිසිම තැනකට නොදෙවැනි කඩොල් ගස් වලින් පිරි ස්ථානයක් නැරඹිය හැකි ය. කඩොලානට කිසිදු හානියක් නොකරන එහි ජීවත් වන්නන් විසින් දැල් පන්න තුල් සඳහා කහටක් ලෙස පොතු ටිකක් ඉවත් කිරීම මිස සෝදපාලු කර බිඳ දැම්මක් අද්‍යත් සිදු නොවේ. මෙම පරිසරයෙහි තවත් ඈතට ගමන් කරන විට ගඟ ගලා බසිනුයේ ගාලු කොළඹ දුම්රිය මාර්ගයේ පාලම යටිනි. මෙම පාලම යටින් ගලා බසින ගඟ ටිකක් දුර යන විට බළපිටිය දුම්රිය පළ පෙනෙන මානයේ හිනටිය වතුගෙදර ගම්පියස බලා යන පාර හරහා තවත් පාලමකින් සැදී ඇත. මෙම පාලම යටින් ගලාබසින ගඟ ක්‍රමයෙන් පුළුල්ව පෙනේ. ගංඉවුර දෙපස ලං කෙරෙන කඩොල් ගසින් පිරි පරිසරයකි. මෙතැන සිට ඈතින් දිස්වනුයේ මසුන් ඇල්ලීම සඳහා එලා ඇති බට පැලලි යොදා සකස් කරන ලද කොටු ය. මෙයට සමහර පෙදෙස් වල අය 'ජාකොටු' යයි කියති. රාත්‍රී කාලයේ කොටු තුළ දැල්වෙන පහන් එළියෙන් මත්වන මසුන් කොටුවේ ඇති ඇතුල් පියස්සට වැටේ. මෙහිදී එකතුවන මසුන් අතුරින් පරටි කට්ල්ලා සහ ඉස්සන් වර්ග වලින් කලිස්සන් විශේෂයෙන් මෙය කොටු තුළ එකතුවන මසුන් ය. මසුන් අල්ලන මෙවැනි කොටු පළල් වූ ගඟ දිගට ම දක්නට ඇත. මේවා අයිති අය එය සාදා ඇති තැන ගඟ බඩ ජීවත් වන්නන් ය. හේන් රැකීමට පැලට යන ගොවියා මෙන් ම රාත්‍රී කාලයේ මසුන් පිරි ජාකොටුව බලා ගැනීමට එය හිමි අය නිතර ඒ වෙනට පැමිණෙන බව දැක ඇත. ගඟ දිගට අවට ගමන් කිරීමෙන් අපට දැක ගත හැකි තවත් තැනකි කප්පිත වලව්ව හා ඒ සමග පසුව සාදන ලද දෙවන උදකුක්ඛේප සීමා මාලක ය.

කප්පිත වලව්ව බළපිටිය පෙදෙස විසූ ප්‍රමුඛ කලාකරුවෙක් වූ මහ මුදලි ටියුඩර් රාජපක්ෂ මහතාට අයත් වූවකි. මහ මුදලි රාජපක්ෂ මහතා දකුණු ලක සිටි ප්‍රභුවරයෙකි.

මාදු ගඟෙහි පිහිටි දෙවන සීමා මාලකයේ දායක කම් රාජපක්ෂ පරපුරට හිමිවේ.




අමරපුර මහ නිකායෙන් කැඩීගිය චූල ගණ්ඨික අමරපුර නිකායේ කොටසේ වතාවත් සිදු වූයේ කප්පිත වලව්ව ආශ්‍රිතව ය. පසු කලෙක මෙම වලව්ව හා ස්ථානය 'ගම්පෙරළිය' චිත්‍රපටිය රූ ගත කිරීමට යොදාගත් බව ප්‍රකට ය. මෙම පරිසරය ද මාදු ගඟබඩ පිහිටි නිසා එයට බෞද්ධ සංස්කෘතික වටිනා කමක් අත්විණි. දූපත් රාශියක් පිහිටි මාදු ගඟ පටන් ගැත්ම වශයෙන් සැලකෙන ලේනගල් පලාන දේහගොඩ එක පසෙකින් ද අනෙක් පසින් දික්ගොඩ පලවූ කන්ද ද සැලකිය හැක. මෙම ස්ථාන ආශ්‍රිත වන ලැහැබ් ද කිපයකි.

මෙම ප්‍රදේශවලින් පටන්ගෙන ගලා බසින මාදු ගඟේ දූපත් රාශියකි. මෙයින් ජලයෙන් වට වූ විශාල දූපතක් ලෙස සැලකෙන පාසලක්, කර්මාන්ත වැඩපලවල්, ඇත්තේ මාදූවේ ය. ඒ අයුරු ම සංස්කෘතික සබඳකම් දක්වන දේවපතිරාජ සෙනෙවි විසින් ප්‍රතිසංස්කරණය කර සාද ඇති කොද්දූව ද වේ. කොද්දූව පන්සල බෞද්ධයන් සිත්ගත් දර්ශනීය වෙහෙරකි.

මෙම විශාල දූපත් වලට අමතරව අද ගොඩබිම සමග සම්බන්ධ වී ඇති දූපත් කිපයකි. ගල්මන්දූව, මහලදූව, වදදූව ඉන් සමහරකි. මෙම ගඟෙහි දූපත් පනහකට වඩා ඇතත් ඉන් බොහොමයක මිනිස්සු වාසය කරති. සමහර දූපත් පවුල් කිපයකට පමණක් සීමාවී ඇත. අත්වරත නාම ඇති දූපත් ද වේ. එවැන්නකි සත පහක හැඩය ඇති සත පහේ දූව.

එද සිට ගැමියන් විසින් සර්පයන් ගෙන ගොස් අතහැර දමන දූපත නයි දූව යි. තව ද තල් දූව, පුවක දූව, දිමි දූව, වෙරළ දූව එබඳු නම් යෙදුණ දූපත් වලින් සමහරකි. විශාල ප්‍රදේශයක පෙනෙන මෙම මාදු ගඟෙහි ගෝන දූව, පෙරිය මරක්කල දූව, එල දූව, පල්ල දූව, තිතිය දූව, අල්ල දූව, ස්වර්ණ දූව තවත් සමහරෙකි. මෙම දූපත්වල වෙසෙන වැසියන් හා ගඟ ආශ්‍රිතව වෙසෙන අය ජීවන වෘත්ති වශයෙන් ගඟෙන් ලබාගන්නා ශාක රැසකි.

ඉන් පලමු තැන ගන්නා ජලජ ශාකයකි ඕලු. සුදු දණ්ඩක් සහ නිල් දණ්ඩක් ඇති ඕලු වර්ග දෙකකි. මෙම ඕලු දඬු ගලවා මිටි බැඳ එළවලු සඳහා බළපිටිය හා අවට කඩපළවලට ගෙන යාම සිරිතකි. පැසුණු ඕලු ගෙඩි වල ඇට කඩපිලට ගෙන එන තවත් භාණ්ඩයකි. ආහාර ලෙස ගන්නා තවත් ජලජ පැලෑටියකි කෙකටිය. මාදු ගඟ සෑම තැන ම වාගේ පිරී ඇති මල් සහිත කෙකටිය ද කඩපල භාණ්ඩවලට එකතුවෙයි. තවත් රසවත් ආහාරයකි තෙත්බිම් පරිසරයට අදාළ කොක්මොට. නැතහොත් කැරංකොකු. කැරගස් කඩොලාන පරිසර වල දක්නට ඇත. මෙහි දළු උසට වැඩෙන කොකු ලෙස දිස්වේ. මෙය රසවත් එළවලුවක් ලෙස පිස ගනී. මාදු ගඟ පරිසරය ආශ්‍රිතව ඉවුරු වලින් ගලා යන වතුර එක්තැන් වී



මාදු ගඟේ මාහලදූව දූපත

තෙත් බිම් සැදී ඇත. මෙය කඩොලාන යි. කඩොලාන ශාක වර්ග වල කඩොල් වර්ග දෙකකි.

මල් කඩොල් සහ මහ කඩොල් යන මේ දෙකෙහි ම මුල් වලින් පිරී මුලු ඉවුරෙහි ම සෙවණ ලබන මසුන්ගෙන් පිරී ඇත. කුඩා පිලා ඔරුවලින් පැමිණ මසුන් මරණ අය දක්නට ලැබේ. එය සුලබ දර්ශනයකි. තව ද පඳුරු ලෙසත් ගස් ලෙසත් දක්නට ලැබෙන දම්පල දම්ගෙඩි අතු නමා වතුරෙහි බහා තබා ඉදුණු පසු කඩපලට ගෙනවුත් විකුණති.

දම් බෝවිටියා වැනි වන එල මෙන් ම මුඛය දම්පාට ගන්වන පලතුරක් ද වේ. මෙම පරිසරයේ ඇති තවත් උස් ගස් වර්ගයකි කිරල. කිරල ගෙඩි කඩා ඉරටුවල එල්ලා කඩපිලට ගෙනවුත් විකිණීම දක්නට ලැබේ.

ඉදුණු කිරල ගෙඩිවල මදය රසවත් කර සාද කෑමට ගනී. මෙහි කදුරු ශාක තුනක් පමණ දක්නට ඇත.

වෙල් කදුරු, ගොන් කදුරු, සහ දිවි කදුරු වේ. අනෝද වර්ග ලෙස වෙල් අතා හා වැලි අනෝද දක්නට ලැබේ. කුඹුක්, කොට්ටම්බ, වෙරළු, දෙඹ, ගොරකා, දිය මිදැල්ල, වල්බෙලි, ලුනු මිදැල්ල ගොඩබිම දෙසට ඇදී එන ගස් වර්ග ය. පත් වර්ග ගැන සඳහන් කරන විට ගල් ඇහැ, බොරුපත්, හීන්පත් ඉවුරු ආශ්‍රිතව වැවේ. ශාක මෙන් ම මෙහි සත්ව වර්ග රාශියකි. සතුන් අතුරින් මසුන් ආහාරයට ගන්නා කුරුල්ලන් ගඟ බඩ වෙසේ. සේරු වර්ග කිපයක් වන කුඩා සේරුවන් හා මල්සේරුවන් විශේෂ තැනක් ගනී. පිළිහුඩුවන් වර්ග දෙකකි. පොඩි මල් පිළිහුඩුවා ලය සුදු පිළිහුඩුවා යන්න යි. කොට්ටෝරුවන්, පරවියන්, නිල කොබෙයියන්, ඇටි කුකුලන්, ලබු ගිරවුන් හා රතු ගිරවුන් ද ඇත. මෙවැනි පරිසරයක දක්නට ඇති කොක්කු, කරවැල් කොකා, කනකොකා හා දියකාවාය. තවත් කුරුළු සම්පතට හිමිකම් කියන කිරලා, ලිහිණි මයිනා සැළලිහිණියා, පොල්කිච්චා ද වේ. රාත්‍රී කාලයට සීමාවූ උලමා, කෙවුල් බස්සා හා මෙම ගණයට අයත් දවල් සැරිසරන බමුණු පිය උකුස්සා දක්නට ලැබේ.

මෙම පරිසරයේ ඇති ගස්වල ලැගුම් ගන්නා කුරුල්ලන්ට මෙය චමත්කාර වන ලැහැබකි. උරග වර්ග අතරින් නයි වර්ග, පොළොං වර්ග, පිඹුරු, දෙපත් නයා දැක ගත හැක. ඉබ්බන් අතුරින් ගල් ඉබ්බා හා කිරි ඉබ්බා ද කිඹුලන් අතර පැල කිඹුලා, හා ගැට කිඹුලා ද ජීවත් වේ. මිනී කන විශාල කිඹුලන් සිටි බවත් ගල් මතුරා දැම්ම නිසා හානිය අවම වී ඇති බවත් ගැමියන්ගේ අදහස යි. කබරගොයා, තලගොයා, කටුසු වර්ග තවත් උරග කොටස් ය. ක්ෂීරපායී සතුන් ලෙස වවුලා, දිය බල්ලා, උගුඩුවා හා හෝතඹුයා යන සතුන් දැක ගත හැක.

අධ්‍යයන කිපයකට භාජනය කරන ලද මසුන් විශේෂ රාශියකි. මිරිදිය මත්ස්‍ය ප්‍රජාව ඉතා සරු ය. ආඳ, දණ්ඩි, පෙතියා, අඟුලුවා, අංකුට්ටා, මගුරා, හුංගා, තෙලියා, කට්ල්ලා, මොද, ඉලත්තයා විශේෂ තැනක් ගනී.

කොරලි, වැලි ගොච්චන් කාවයියන් රැසකි. ඉස්සන් අතර තෙලිස්සා සහ කිරි ඉස්සා බහුලව දක්නට ඇත. කකුළුවන් ලෙස කලු කකුළුවා සහ කඩොල් කකුළුවාත් මට්ටියන් ලෙස කඩොල් මට්ටියා ද වේ. මෙම මසුන් අල්ලා ආහාරය සඳහා ප්‍රයෝජනයට ගන්නා හා කඩපොළ වලට ගෙන අලෙවි කරන අය ද වෙති. මේ ලෙස ශාක හා සත්ව ප්‍රජාවක් මාදු ගඟේ ජෛව විවිධත්වය විදහා පායි.

මාදු ගඟ පරිසරය අප රට ලත් ස්වාභාවික දායාදයකි. කුඩා කළ සිට ම මා මෙම පරිසරය අසල හැදී වැඩී ඇති ජෛව විවිධත්වය අගය කරන ජීව විද්‍යාඥයෙකි. මෙම පරිසරයේ ඇති ශාක හා සතුන් එද මෙන් ම අදත් සරු සාරව ජීවත් වේ.

පරිසරය කෙලසීම නැතිව පවිත්‍ර ගංගාවක් ලෙස පැවැත්මට ගම්වැසි කොටසක් දිරි වඩති. තව ද හැඟීමකින් තොරව රට මුදල් ලබා ගැනීමේ චේතනාවෙන් පාරිසරික සංචාරක දැහැනක් ලෙස සැලකීමට දිරි වඩන අය ද රැසකි. එම ක්‍රියාවලිය සීමාන්විත සැලැස්මක් ලෙස පැවැත්වුවහොත් ජෛව විවිධත්වයට වන අහිතකර බලපෑම අඩු කරගත හැකි ය. මාදු ගඟෙහි ඇති ශාක සත්ත්ව ප්‍රජාවට අමතරව ලැබී ඇති මහඟු බෞද්ධ සංස්කෘතික දායාදය ද සුලුපටු නොවේ.

සොබා දහම සහ බෞද්ධ සංස්කෘතික ක්‍රියාදාමයන් එක් රැස් කරගත් මාදු ගඟ පරිසරය ඒ අයුරුම රැකගැනීම ප්‍රදේශ වාසීන්ට පමණක් නොව මුළු රටට ආස්වාදයක් වන පිටුවහලකි.